සැ. යු. — 2011.12.23 වැනි දින පළ වූ අංක 1,738 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,739 - 2011 දෙසැම්බර් මස 30 වැනි සිකුරාදා - 2011.12.30**

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I කොටස : (III) වැනි ඡේදය - වෙළෙඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම් … … | — | කාර්මික සැළසුම් පිළිබඳ නිවේදන … … | — |
| වෙළෙඳ ලකුණු පිළිබඳ නිවේදන … … | — | විවිධ දැන්වීම් … … | — |
| පේටන්ට් බලපත්‍ර පිළිබඳ නිවේදන … … | 648 | | |

සැ. යු. — ශ්‍රී ලංකා ප්‍රජා ඖෂධවේදීන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 සැප්තැම්බර් මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

රොෂාන් රණසිංහ ජනසහන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 සැප්තැම්බර් මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 ඔක්තෝබර් මස 14 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන්, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නො ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ජනවාරි මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 දෙසැම්බර් මස 23 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08.
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

647 - B 80391—3,050 (2011/12)
C1-

# වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළඳ ලකුණුවලට අදාළ සියලු ම ලියුම් කියුම් කොළඹ 10, ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 400, "සමාගම් මැඳුරේ" 3 වැනි මහලේ පේටන්ට් බලපත්‍ර සහ සහ වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතු ය.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ සෑම ක්‍රියාකාරී දිනක ම පෙරවරු 9.00 සිට පස්වරු 3.30 දක්වා ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා ඉල්ලුම්පත්‍ර සතියේ වැඩ කරන දිනවල පස්වරු 2.00 දක්වා පමණක් භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළෙඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළෙඳ ලකුණක් යම් යම් වර්ණයකට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමග ඉදිරිපත් කරනු ලබන වෙළඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති ලකුණක් , 1979 අංක 32 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහ පනතේ 112 වැනි වගන්තිය යටතේ, තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිතා කරනු ලබන බවට සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකය ද දක්වනු ලැබේ.

### විරෝධතා දැක්වීම

පහත සඳහන් වෙළෙඳ සේවා හෝ සාමූහික ලකුණු ලියාපදිංචි කිරීම ගැන විරෝධතාවය දැක්වීමට හේතු ඇති යම් කෙනෙකු මෙම *ගැසට් නිවේදනයේ* දින සිට තුන් මාසයක් ඇතුළත ඇම් 2 දරන ආකෘති පත්‍රය (අනු පිටපතකින් ද යුක්තව) මගින් විරෝධතා දැක්වීම ඉදිරිපත් කළ යුතු ය. එබඳු විරෝධතා දැක්වීමක් සඳහා ගාස්තුව රු. 750ක් වන අතර එම ගාස්තුව මුදලින්, චෙක්පතකින්, මුදල් ඇණවුමකින්, තැපැල් ඇණවුමකින් හෝ බැංකු අණකරයකින් ගෙවිය යුතු ය.

# පේටන්ට් බලපත්‍ර පිළිබඳ නිවේදන

**2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනත**

**වගන්තිය 79 (2) (ආ)**

මෙම නිවේදනය පළකර මාස 3කින් පසු පහත ඉල්ලුම්කරුවන්ට පේටන්ට් ලබාදීමට හැකියාව ඇති බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. :-

| | | |
|---|---|---|
| (1) ඉල්ලුම්පත්‍ර අංකය: 13546 ; | (2) ඉල්ලුම්කරු : ඉන්සිග්නියොන් හෝල්ඩිංස් ලිමිටඩ් ඇන්ඩ් වෙරිටන් ලිමිටඩ්; | (3) නව නිර්මානයේ නම: සංයුතිය සහ එහි චිකිත්සක භාවිතය ; |
| (1) ඉල්ලුම්පත්‍ර අංකය: 13595 ; | (2) ඉල්ලුම්කරු : ග්ලැක්සෝ ගෲප් ලිමිටඩ්; | (3) නව නිර්මානයේ නම: පිරිමිඩින් ව්‍යුත්පන්න සහ CB2 මධ්‍යස්ථක ලෙස ඒවා භාවිත කිරීම ; |
| (1) ඉල්ලුම්පත්‍ර අංකය: 13864 ; | (2) ඉල්ලුම්කරු : රසල් ස්මිත් කෙවාන් වෝගන්; | (3) නව නිර්මානයේ නම: තොග අංශුමය ද්‍රව්‍ය ඝණ කිරීම; |
| (1) ඉල්ලුම්පත්‍ර අංකය: 14013 ; | (2) ඉල්ලුම්කරු : සන් ෆාමසියුටිකල් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්; | (3) නව නිර්මානයේ නම: මුඛමය ඖෂධ ප්‍රවාහන පද්ධතිය; |
| (1) ඉල්ලුම්පත්‍ර අංකය: 14016 ; | (2) ඉල්ලුම්කරු : වෝනර් ලැම්බර්ට් කම්පැණි, LLC ; ඇබ්ජිනික්ස් ඉන්කෝ ඇන්ඩ් ඇම්ගන් ෆ්‍රෙමන්ට් ඉන්කෝ; | (3) නව නිර්මානයේ නම: M-CSF සඳහා ප්‍රතිශක්තිකාරක; |
| (1) ඉල්ලුම්පත්‍ර අංකය: 14026 ; | (2) ඉල්ලුම්කරු : මොහොමඩ් නයිෆර් මොහොමඩ් සුබායිර්; | (3) නව නිර්මානයේ නම: පිට්ටු මිශ්‍රණය; |
| (1) ඉල්ලුම්පත්‍ර අංකය: 14383 ; | (2) ඉල්ලුම්කරු : ලාස් එකරත්; | (3) නව නිර්මානයේ නම: තීව්‍ර, ඉන්ධන කාර්යක්ෂම ජෛ විද්‍යාත්මක (අපද්‍රව්‍ය) ජල ප්‍රතිකාරක ක්‍රියාවලිය සහ ප්‍රතික්‍රියාකාරකය; |

(1) ඉල්ලුම්පත්‍ර අංකය: 14648 ; (2) ඉල්ලුම්කරු : හචිසන් වැම්පෝවා ත්‍රී GIP (බහමාස්) ලිමිටඩ්; (3) නව නිර්මානයේ නම: ජංගම සන්නිවේදන ජාලයේ නිවාස කලාපීය යෙදුම ක්‍රියාත්මක කිරීමේ ක්‍රමය;

(1) ඉල්ලුම්පත්‍ර අංකය: 14890 ; (2) ඉල්ලුම්කරු : හචිසන් වැම්පෝවා ත්‍රී GIP (බහමාස්) ලිමිටඩ්; (3) නව නිර්මානයේ නම: ජංගම සන්නිවේදන ජාලයේ නිවාස කලාපීය යෙදුම ක්‍රියාත්මක කිරීමේ ක්‍රමය;

(1) ඉල්ලුම්පත්‍ර අංකය: 15549 ; (2) ඉල්ලුම්කරු : යද්දෙහිගේ හසිත ප්‍රසාද්; (3) නව නිර්මානයේ නම: යන්ත්‍රයක් රහිතව ටයරය රිම් එකෙන් ඉවත් කර සවි කිරීම;

(1) ඉල්ලුම්පත්‍ර අංකය: 15850 ; (2) ඉල්ලුම්කරු : හබරාගමු කෝරාලගේ සුසිල් රන්ජිත් සුමනසිරි පෙරේරා; (3) නව නිර්මානයේ නම: P. V. C. ත්‍රී රෝද බඟර (ය) ;

(1) ඉල්ලුම්පත්‍ර අංකය: 16128 ; (2) ඉල්ලුම්කරු : උස්වත්ත ලියනගේ චන්ද්‍රසෝම පෙරේරා; (3) නව නිර්මානයේ නම: ත්‍රිකෝණමිතික දත්ත මීටරය (ය) ;

12-1143

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.